(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 101. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 ඔක්තෝබර් 21 බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 ට**

# පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා,** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** ප්‍රවාහන අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ටිරාන් අලස් මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

**ගරු  අබ්දුල් හලීම් මහතා**

**ගරු  කබීර් හෂීම් මහතා**

**ගරු  (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු  ජයරත්න හේරත් මහතා**

**ගරු  සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු  මර්ජාන් ෆලීල් මහතා**

**ගරු  ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 ඔක්තෝබර් 13 දින ම'විසින් 'ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන)' සහ 'සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන)' යන පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

II

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධාන සහ 2021 සැප්තැම්බර් 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේදී සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම පිණිස මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි:—

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) කම්කරු අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා මහාමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) ප්‍රවාහන අමාත්‍යවරිය විසින්—

(i) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2020 වර්ෂය සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 සහ 2019 වර්ෂ සඳහා සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර එම වාර්තා, විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) වෙළඳ අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(8) රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(9) වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(10) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 2247/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි පිළිගන්වා එම රෙගුලාසි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2018/2019 වර්ෂය සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) සංචාරක අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන්; සහ

(ii) ජාතික විගණන කාර්යාලයේ 2022 වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු එම්. යූ. එම්. අලි සබ්රි මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) (සංශෝධන) පනත් කෙටුම්පත;

(iii) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත; සහ

(iv) සිවිල් නඩු විධාන සංග්‍රහයේ (101 වන අධිකාරය) 214 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී සංග්‍රහයේ 840 වන වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලද 2021 ජූලි මස 02 දිනැති අංක 2234/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) මාදිපොල, මහවැහැර, 'සම්පත් නිවස' යන ලිපිනයෙහි පදිංචි බී. ජී. ආනන්ද බුලනවැව මහතාගෙන් ලැබුණු 2021.07.05 දිනැති පෙත්සම; සහ

(ii) කල්මුණ, පාන්ඩිරිප්පු 01, තෝම්බුවර් පාර යන ලිපිනයෙහි පදිංචි වී. ආරියරත්නම් මහතාගෙන් ලැබුණු 2021.05.17 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) ගලේවෙල, දඹගොල්ල පාර, අංක 348 දරන ස්ථානයෙහි පදිංචි එල්. එච්. චන්ද්‍රකාන්ති මහත්මියගෙන් ලැබුණු 2021.07.01 දිනැති පෙත්සම ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. විසර්ජන (සංශෝධන):** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා පිළිගැන්වූ පනත් කෙටුම්පත,—2020 අංක 7 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 නොවැම්බර් 08 සඳුදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2021 ඔක්තෝබර් 22 සිකුරාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 5.30 දක්වා විය යුතු ය. මධ්‍යහන 12.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— "විසර්ජන" පනත් කෙටුම්පත (2022) සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(1) හි සඳහන් "විසි හය" යන වචන වෙනුවට "විසි තුන" යන වචන ආදේශ කිරීමෙන් ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2021 නොවැම්බර් 13 සෙනසුරාදා, 15 සඳුදා, 16 අඟහරුවාදා, 17 බදාදා, 19 සිකුරාදා, 20 සෙනසුරාදා සහ 22 සඳුදා "විසර්ජන" පනත් කෙටුම්පත (2022) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2022) සලකා බැලීම සඳහා 2021 නොවැම්බර් 13 සෙනසුරාදා සිට 2021 නොවැම්බර් 20 සෙනසුරාදා දක්වා වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේද ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2022) සලකා බැලීම සඳහා වෙන්කළ 2021 නොවැම්බර් 22 සඳුදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**11. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු චන්දිම වීරක්කොඩි මහතා, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"දස්සනා බෞද්ධ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත **බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා** වෙත යොමු කරන ලදී.

**12. තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය" යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ.භා. 11.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි ගරු මධුර විතානගේ මහතා, ගරු උද්දික ප්‍රේමරත්න මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.30 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය. )

(අ.භා. 2.49 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ලුහුඬු නාමය සහ
ක්‍රියාත්මක වීමේ
දිනය",

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

2 වැනි වගන්තිය සහ 3 වැනි වගන්තිය සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 15 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"4. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ "තරුණ තැනැත්තා";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 1 වැනි පිටුවේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ප්‍රධාන ප්‍රඥප්තියේ
16 වන වගන්තිය
සංශෝධනය කිරීම"

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

5 වැනි වගන්තිය සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය**

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තෙවැනිවර කියවිය යුතු ය" යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තෙවැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**13. දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය" යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය**

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තෙවැනිවර කියවිය යුතු ය" යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තෙවැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**14. සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ නියෝග:** අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (101 අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 214 වගන්තිය සමඟ කියවිය යුතු 840 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජූලි 02 දිනැති අංක 2234/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. කල් තැබීම (කාබනික කෘෂිකර්මාන්තයට ක්ෂණිකව යොමුවීමේ ගැටලු):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතු ය" යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

"ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.08 ට ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.)

"ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.12 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 6.00 පසු කර තිබූයෙන් අ.භා. 6.03 මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් 2021 ඔක්තෝබර් 08 දින සභා සම්මතිය අනුව ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 ඔක්තෝබර් 22 සිකුරාදා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.